# 04

# ළමා සමාජය

"ආ ...... සිරිමල්, ඇයි ඔයා ආවේ නැත්තේ? අද නම් අපේ සුමග ළමා සමාජයට ගොඩක් අය ඇවිල්ලා හිටියනේ" අතරමග දී මුණ ගැසුණු සිරිමල්ගෙන් පැතුම් විමසී ය.

"මම අද අම්මා එක්ක ආච්චි බලන්න ගියා. තව ම ආච්චි ඉස්පිරිතාලෙ නේ" සිරිමල් පිළිතුරු දුන්නේ ය.

"ඒක නෙවේ, කොහොම ද සමිතියේ වැඩ කටයුතු?" සිරිමල් ඇසී ය.
හොඳට කෙරුණා. අපේ අනුශාසක හාමුදුරුවොයි, විදුහල්පතිතුමයි හොඳ අනුශාසනා දෙකක් කළා" පැතුම් කී ය.



"මොනව ද විශේෂයෙන් කිව්වේ?" සිරිමල් ඇසී ය.

"මතක ද අපි ගිය වතාවේ සමිතියේ දී යෝජනාවක් කළා, මත්පැන් දුම්වැටිවලට විරුද්ධ ව ගමේ පෝස්ටර් අලවන්න. ඉතින් ඒක අපට තව ම කරන්න බැරි වුණා නේ. ඒ වගේ ගමට වැඩක් වෙන දේවල් ගොඩක් අපට කරන්න පුළුවන් කියලා හාමුදුරුවෝ මතක් කරලා දුන්නා. ඒ විතරක් නොවෙයි. අප තුළ හොඳ ගුණධර්මත් ඇති කර ගන්න ඕනෑ කියල කිව්වා. ඒත් එක්ක ම හොඳට ඉගෙන ගන්නත් අප දිරිමත් කළා." තුෂාර කී ය.

"කොහොම ද අලුත් නිලධාරින් පත් වුණා ද?" සිරිමල් ඇසී ය.

“ඔව් ඔව්, පැතුම් තමයි අපේ සභාපති. මේ ඉන්නේ භාණ්ඩාගාරික” කියමින් සුපුන් තුෂාරගේ අතින් අල්ලා ගත්තේ ය.
“එතකොට ලේකම් කවුද?” සිරිමල් ඇසී ය.

“මේ වතාවෙත් ලේකම්තුමිය වුණේ නාලිනී තමයි.” තුෂාර කී ය.

“හොඳයි, හොඳයි, හොඳට වැඩ කරන්න. අපිත් පුළුවන් තරම් සහයෝගය දෙනවා” සිරිමල් පැතුම් දෙසට හැරී කී ය.

“ඔව්, ඔව්, හැමදෙනාගේ ම සහයෝගය ඕනෑ. නැති ව ඉතිං මට තනියෙන් සමිතිය කරන්න බැහැ නේ” පැතුම් පැවසී ය.

“හරි හරි, තව සති දෙකකින් ආයෙත් අපි පන්සලට රැස්වෙලා සමිතිය තියනවා නේ. එදට ඉතින් සිරිමල්ටත් එන්න බැරියැ?” නිලන්ත කී ය.

“ඔව් ස්ථිර ව ම මං එදට එනවා”යැයි කී සිරිමල් ඔවුන්ගෙන් සමුගෙන, තම නිවසට ගියේ ය.

“ඒකයැ, අද සුනිල් කරපු යෝජනාව නම් ඉතා ම හොඳයි නේ ද?” සම්පත් සිහිපත් කළේ ය.

“ආ .... අර පන්සලට යන පාර දෙපැත්තේ කොහොඹ ගස් හිටුවන්න කරපු යෝජනාව ද?” සුපුන් විමසී ය.

“ඔව්, ඔව්, ඒකටත් එක්ක නිර්මාල්, කාගෙ හරි වැරැද්දක් අඩුපාඩුවක් ගැන විතරමයි එයා කතා කළේ.” සම්පත් කීවේ නො සතුටිනි.

“අපිත් ඉතිං අනිත් අයගේ අඩුපාඩු ගැන කියව කියවා ඉන්න ඕනැ නෑ. අපිට කරන්න පුළුවන් දෙයක් කරමු.” පැතුම් කී ය.

“ ආ ........ මොකද? නිලන්ත හොරගල් අහුලන්නේ, අඹ ගහ දිහා බලාගෙන” වටපිට බලමින් පිටුපසින් ම පැමිණි නිලන්තගෙන් සම්පත් ඇසී ය.

“නෑ, මං මේ ඉදිච්ච අඹ තියනව ද බැලුවා. ගොඩක් තියන තැනකින් ගෙඩියක් දෙකක් කඩාගත්ත ම මොකද?” නිලන්ත ඊට පිළිතුරු දුන්නේ ය.

“ කමක් නෑ. කමක් නෑ. හැබැයි ඕවා අයිති අයගෙන් අහලා අවසර ගන්න ඕනැ. ආන්න ..... සියාතු සීයා ගේ ඉස්සරහ ම ඉන්නවා ගිහින් අහලා එන්න.” සම්පත් නිලන්තට කී ය.

“සීයේ, අඹ ගහේ ගෙඩි නං ගොඩක් ඉදිලා තියෙන්නේ. අපි ගෙඩි පහක් කඩා ගන්න ද?” නිලන්ත සියාතු සීයාගෙන් විමසී ය.

“අනේ දරුවනේ, උඹලා මොකට කරදර වෙනව ද? මෙහෙ වරෙල්ලකෝ. මේන් මං ඇහිඳපු අඹ තියෙනවා. උඹලා ඕනෑ තරම් ගනිල්ලකෝ ” සියාතු සීයා කී ය.



“ආනේ, හොඳට ඉදිච්ච අඹ සීයාට ගොඩක් පිං” ළමයි කීහ.

“දරුවනේ, ඕවා අර වතුර බේසමෙන් හෝදාගෙන කාපල්ලා”යි සීයා කී විට ළමයි අඹ ගෙඩි රැගෙන වතුර බේසම ළඟට ගියහ.

“එහෙනම් සීයේ, අපි යනවා. පස්සේ වෙලාවක එන්නම්” ළමයි කීහ.

“හා, හා. ඕනෑ වෙලාවක වරෙල්ලා දරුවනේ” සියාතු සීයා කාරුණික ව කී ය.

“දැක්කා නේ ද? අපි අඹ හොරෙන් කඩන්නේ නැති, ව සියාතු සීයාගෙන් ඉල්ල ගත්ත එක කොච්චර හොඳ ද? සීයා අපිට අඹ ගෙඩි දහයක් ම දුන්න නේ” තුෂාර කී ය.

“පිරිසිදු සිතින් වැඩ කරන කොට ලැබෙන ප්‍රතිඵලයත් හොඳයි කියන්නේ ඕක නේ ” පැතුම් කී ය.

“මේ අඹ දුන්න පිනෙන් සියාතු සීයා ලබන ආත්මේ අඹ උයනකට අධිපති දෙවියෙක් ම වේවා!” කටකාර සුපුන් කී විට ළමයි සියල්ලෝ ම මහ හඬින් ඊට සිනාසුණහ. ඔවුහු අඹ ගෙඩිවල රස බලමින් තම තමන්ගේ නිවාසවලට ගියහ.

## ක්‍රියාකාරකම්

01). පහත දැක්වෙන්නේ පාඩමෙන් උපුටා ගත් පද කිහිපයකි. එම පද ඇතුළත් කොට අර්ථවත් අලුත් වාක්‍ය නිර්මාණය කරන්න.

i. ළමා සමාජය
ii. දවස් තුන හතරක්
iii. සමිතියේ වැඩ කටයුතු
iv. හොඳ ගුණධර්ම
v. සති දෙකකින්
vi. පාර දෙපැත්තේ

### භාෂා භාවිතය

01). පහත දැක්වෙන වාක්‍යවල ඉරි ඇඳි පද විමසා බලන්න. ඒවා ක්‍රියා පද යි. මෙම ක්‍රියා පද ප්‍රථමපුරුෂ, මධ්‍යමපුරුෂ, උත්තමපුරුෂ වශයෙන් ද, අතීත, අනතීත වශයෙන් ද වෙනස් වෙයි.

| පුරුෂය | වචන | අතීත | වචන | අනතීත |
|---|---|---|---|---|
| ප්‍රථම පුරුෂ | ඒක වචන | ළමයා පාඩම් කළේ ය | ඒක වචන | ළමයා පාඩම් කරයි |
| | බහු වචන | ළමයි පාඩම් කළෝ ය/කළහ | බහු වචන | ළමයි පාඩම් කරති |
| මධ්‍යම පුරුෂ | ඒක වචන | නුඹ පාඩම් කළෙහි | ඒක වචන | නුඹ පාඩම් කරහි/කරන්නෙහි |
| | බහු වචන | නුඹලා පාඩම් කළෙහු | බහු වචන | නුඹලා පාඩම් කරහු /කරන්නෙහු |
| උත්තම පුරුෂ | ඒක වචන | මම පාඩම් කළෙමි | ඒක වචන | මම පාඩම් කරමි |
| | බහු වචන | අපි පාඩම් කළෙමු | බහු වචන | අපි පාඩම් කරමු |

02.) දී ඇති වචන යොදා පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

බලයි, බලති, බලහි, බලහු, බලමි, බලමු, බැලුවේ ය,
බැලුවෝ ය/බැලූහ, බැලුවෙහි, බැලුවෙහු, බැලුවෙමි, බැලුවෙමු.

| පුරුෂය | ඒකවචන | | බහුවචන | |
|---|---|---|---|---|
| | අතීත | අනතීත | අතීත | අනතීත |
| ප්‍රථමපුරුෂ | | | | |
| මධ්‍යමපුරුෂ | | | | |
| උත්තමපුරුෂ | | | | |

03.) ගැළපෙන වචන යොදා හිස්තැන් සම්පූර්ණ කරන්න.

i. ........................................ අවසර ගනියි.
ii.. ........................................ හොරගල් අහුලයි.
iii. ........................................ පිළිතුරු දෙති.
iv. ........................................ අල්ලා ගනිති.
v. ........................................ දිරිමත් කරමි.
vi. ........................................ ඉල්ලා ගනිමු.
vii. ........................................ සහයෝගය දෙන්නෙහු.
viii. ........................................ පසු ව පැමිණෙහි.

04.) පහත දැක්වෙන එක් එක් වචන යොදා ගෙන අර්ථවත් වාක්‍යය බැගින් ගොඩනගන්න.

**i** **දුනිමි**
**ii** **කළහ**
**iii** **කීවේ ය**
**iv** **බැලුවෙහි**
**v** **ගියෙහු**
**vi** **නැරඹුවෙමි**

05.) පාඩමෙහි දැක්වෙන මෙම අතීත කාල වාක්‍ය අනතීත කාලයට හරවා නැවත ලියන්න.

i. සුපුන් තුෂාරගේ අතින් අල්ලා ගත්තේ ය.
ii. සිරිමල් ඔවුන්ගෙන් සමුගෙන නිවසට ගියේ ය.
iii. නිලන්ත ඊට පිළිතුරු දුන්නේ ය.
iv. ළමයි අඹ ගෙඩි රැගෙන වතුර බේසම ළඟට ගියහ.
v. ළමයි හැමෝ ම මහ හඬින් ඊට සිනාසුණහ.
vi. ඔවුහු අඹ ගෙඩිවල රස බලමින් තම නිවාසවලට ගියහ.

06.) පහත දැක්වෙන වාක්‍ය අතීත කාලයට හරවන්න

i. ළමයි විහාරස්ථානයට පැමිණෙති.
ii. ඔහු කතාවක් පවත්වයි.
iii. නිමල් ද කමල් ද ගෙදර යති.
iv. ඔවුහු අඹ ගෙඩි අහුලති.
v. ලේකම්තුමිය වාර්තාව කියවයි.

07.) පහත දැක්වෙන ඡේදයෙහි හිස්තැනට සුදුසු වචන අදාළ වරහන් තුළින් තෝරා එම ඡේදය ඔබේ අභ්‍යාස පොතෙහි ලියන්න.

(ඔහු/අපි/නුඹලා) උදේ ම පාසලට පැමිණෙන විට සුනිල්ගේ නිවසට ද ගියෙමු. (නුඹ/ඔවුහු/ඔහු) පෙර දින පාසල් නොපැමිණියේ මන්දැයි සොයා බැලීම අපගේ අරමුණ විය. අප එහි යන විට සුනිල් තම පියා සමඟ කුඹුරට යාමට සූදානම් වී සිටියේ ය. “ඔයා අද පාසල් එන්නේ නැද්ද?'' (අපි/නුඹලා/ඔහු) ඔහුගෙන් විමසුවෙමු. “(ඔයාලා/නුඹ/මම) යන්න. මම අද එන්නේ නෑ'' ඔහු කී ය. (නුඹ/ඇය/ඔහු) දුප්පත් අයෙකු වුව ද ඉගෙනීමට දක්ෂ අයෙක් විය. අපගේ පාසල් සමිතියේ ලේකම්වරයා වූයේ (ඔහු/නුඹලා /අපි) ය.

**පැවරුම්**

01.) පාඩම නැවත අවධානයෙන් කියවන්න. එහි දැක්වෙන පරිදි, ළමයින්ගේ කතාබහ ඇසුරෙන් හෙළිවෙන තොරතුරු උපයෝගී කරගෙන ළමයින් පැවැත්වූ ළමා සමාජය සහ ඒ පිළිබඳ විස්තරයක් ලියන්න. ඔබට මෙසේ එම විස්තරය ආරම්භ කළ හැකි ය.

උදා : ගමේ විහාරස්ථානයට එක් වූ ළමයි සුමඟ ළමා සමාජයේ සමිති වාරයක් පැවැත්වූහ. ළමා සමාජයෙහි අනුශාසකවරුන් වන .........

02.) ''යහපත් පුරවැසියෙකු බිහි කළ හැකි වන්නේ කෙසේ ද?'' යන මාතෘකාවට අදාළ කරුණු ඔබගේ මිතුරන් සමඟ සාකච්ඡා කොට පුවත්පතකට ලිපියක් ලියන්න.